## 'ආ' කොටස - රචනා

8. (a) (i) පහත සඳහන් පරිවර්තන කෙසේ සිදු කළ හැකිදැයි තුලිත සමීකරණ ආධාරයෙන් දක්වන්න. අවශ්‍ය ප්‍රතිකාරක සහ ප්‍රතික්‍රියා තත්ත්ව දැක්විය යුතුය. ඒ ඒ ආරම්භක මූල ද්‍රව්‍ය අවසාන ඵලයට පරිවර්තනය වීමේදී ඔක්සිකරණ අංකයේ ඇති වන වෙනස දක්වන්න.

$S \rightarrow H_2S_2O_7$

$Cl_2 \rightarrow NaClO$

(ii) ආවර්තිතා වක්‍රයේ හයිඩ්‍රජන්, ක්ෂාර ලෝහ සහ හැලජන් යන දෙකම සමඟ වර්ගීකරණය කිරීම සඳහා හේතු දක්වන්න.

(b) (i) ඔක්සිජන්වල මවුලික පරිමාව සෙවීම පිණිස පරීක්ෂණාගාරයේදී සිදු කළ හැකි වියෝජන ප්‍රතික්‍රියාවක් ඉදිරිපත් කරන්න.

(ii) මවුලික පරිමාව නිර්ණය කිරීමට අවශ්‍ය පරීක්ෂණාත්මක කරුණු සම්පූර්ණයෙන් දක්වන්න.

(iii) ගණනය සඳහා අදාළ පියවර දක්වන්න.

(c) (i) ඝන KBr සහ ඝන $KNO_3$ ඇති මිශ්‍රණයකට සා. $H_2SO_4$ එකතු කර රත් කළ හොත් ඔබට කුමක් නිරීක්ෂනය වේදැයි අනාවැකි ලෙස ප්‍රකාශ කරන්න.

(ii) මෙම මිශ්‍රණයේ $NO_3^-$ ඇති බව ස්ථිර කිරීමට ඔබ උත්සාහ කරන්නේ කෙසේද?

9. (a) (i) මිනිරන් හා දියමන්ති යන ඒ ඒ ද්‍රව්‍යවල කැපී පෙනෙන එක ලාක්ෂණික ගතිගුණයක් බැගින් දෙන්න. එම ගතිගුණ ඒ ඒ ද්‍රව්‍යවල ව්‍යුහ ආධාරයෙන් පහද දෙන්න.

(ii) සිල්වර් (රිදී) ලෝහයට පහත දැක්වෙන ගුණ ඇත්තේ මන්දැයි පහදන්න.

1. ඉතා ඉහළ විද්‍යුත් සන්නායකතාවයක් 2. ඉහළ ද්‍රවාංකයක්

(b) (i) ආවර්තිතා වක්‍රයේ ප්‍රථම කාණ්ඩයේ ආන්තරික නොවන මූලද්‍රව්‍ය මෘදුවීම, හොඳ ඔක්සිහාරකයන් වීම, පහසුවෙන් ඒක සංයුජ අයන සෑදීම පහද දෙන්න.

(ii) පහත දැක්වෙන නිරීක්ෂණ පහද දෙන්න.

1. ආම්ලීකෘත $FeCl_2$ ද්‍රාවණයකට $AgNO_3$ ද්‍රාවණයක් එකතු කළ විට ලැබෙන සුදු අවක්ෂේපය ඇමෝනියා එකතු කළ විට කලු පාටට හැරේ.

2. $Al_2(SO_4)_3$ ද්‍රාවණයක් $NaHCO_3$ ද්‍රාවණයක් සමඟ ප්‍රතික්‍රියා කරවූ විට $Al(OH)_3$ අවක්ෂේපයක් ලෙස සෑදේ.

(c) ජලීය HF, HCl, HBr, HI යන ද්‍රාවණවල ආම්ලික ස්වභාවය විචලනය වන ආකාරය දක්වන්න. ඒවායේ විචලන පහද දෙන්න.

10. (a) සමෝධානික (Integrated) රසායනික කර්මාන්ත ව්‍යාපෘතියක් සඳහා සේරුවිල යකඩ නිධිය, ඇපටයිට්, හුණුගල් සහ ගල් අඟුරු භාවිත කිරීමට එක්තරා කර්මාන්ත ශාලා හිමියෙක් යෝජනා කරයි. උපරිම ආර්ථික වාසි ලබා ගැනීම උදෙසා ඔහු අතුරුඵලවල උපරිම ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරයි.

(i) ඉහත ව්‍යාපාරයෙන් ලබාගත හැකි විවිධ නිෂ්පාදන සුදුසු අපවහන සටහනක් (Flow Chart) ආධාර කොට ගෙන අදාළ තැන් වලදී ඵල යටින් ඉරි ඇඳීමෙන් පෙන්වා දෙන්න.

(ii) මෙම සමෝධානික රසායනික කර්මාන්ත ව්‍යාපාරයෙන් ලබා ගත හැකි ඵල 4 කට අදාළව එක ප්‍රයෝජනයක් බැගින් දෙන්න.

(b) ශ්‍රී ලංකාවේ පවතින ඩොලමයිට්, තේ වැනි දීර්ඝ කාලීන වගා වලට පොහොරක් වශයෙන් භාවිතා කරයි.

(i) කෘෂිකර්මය සඳහා පස වඩාත් යෝග්‍යමත් කිරීමට ඩොලමයිට් උපකාරී වන ආකාර 2ක් දෙන්න.

(ii) වී ගොවිතැන වැනි කෙටි කාලීන වගා සඳහා ඩොලමයිට් සුදුසු නොවන්නේ මන්ද?

(c) අවසාදිත පාෂාණයක් යනු කුමක්ද? අවසාදිත පාෂාණ සෑදීමේ ක්‍රියාවලිය පහද දෙන්න. ශ්‍රී ලංකාවේ පවතින අවසාදිත පාෂාණවලට උදාහරණ දෙන්න.

---

## 1987 අගෝස්තු - රසායන විද්‍යාව

### I කොටස

1. සිල්වර්වල පරමාණුක ක්‍රමාංකය 47 වේ. ඇතැම් තත්ව යටතේ සිල්වර් වලින් $Ag^{2+}$ යන කැටායනය සෑදේ. $Ag^{2+}$ හි ඇති මුළු d ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව

(1) 9 ක් වේ. (2) 10 ක් වේ. (3) 18 ක් වේ.
(4) 19 ක් වේ. (5) 20 ක් වේ.

2. ඇලුමිනියම් ලෝහය 5.4 g වැඩිපුර ජලීය ක්ෂාරය සමඟ ප්‍රතික්‍රියා කර වීමෙන් ලැබෙන හයිඩ්‍රජන් වායු පරිමාව ස.උ.පී. දී කොපමණ වේද? (Al = 27.0)

(1) 1.12 $l$ වේ. (2) 2.24 $l$ වේ. (3) 3.36 $l$ වේ.
(4) 4.48 $l$ වේ. (5) 6.72 $l$ වේ.

3. ඉලෙක්ට්‍රෝනයක ස්කන්ධය

(1) $\frac{1.008}{1840}$ g වේ. (2) $\frac{1.008}{96490} \times \frac{1}{1840}$ g වේ.

(3) $9.107 \times 10^{-28}$ g වේ. (4) $\frac{96490}{6.022 \times 10^{23}}$ g වේ.

(5) $\frac{1.008}{6.022 \times 10^{23}}$ g වේ.

4. 'සාපේක්ෂ පරමාණුක ස්කන්ධය' යන සංකල්පය පැහැදිලි ලෙස අවබෝධ කර ගැනීමේදී වඩාත්ම ප්‍රයෝජනවත් වූයේ මින් කවරකුගේ හැදෑරීම්ද?

(1) ඩෝල්ටන්ගේ හැදෑරීම් (2) කැනිට්සාරෝගේ හැදෑරීම්
(3) තොම්සන්ගේ හැදෑරීම් (4) රදර්ෆඩ්ගේ හැදෑරීම්
(5) ෆැරඩේගේ හැදෑරීම්

5. මින් අස්ථායි වන සමස්ථානිකය කුමක්ද?

(1) $2H^+$ (2) $^3_1H$ (3) $^{18}_{8}O$ (4) $^{4}_{2}He$ (5) $^{23}_{11}Na$

6. 'අණුව' යන සංකල්පය සමඟ වඩාත්ම සමීපව ආශ්‍රිත වන්නේ මින් කුමක්ද?

(1) ගුණානුපාත නියමය (2) අන්‍යෝන්‍ය සමානුපාත නියමය
(3) ගේ ලුසැක් නියමය (4) ඩුලෝං සහ පෙටි නියමය
(5) ඩෝල්ටන් නියමය

7. මින් කුමන සංයෝගයේදී අන්තර් අණුක බල ඉහළින්ම ප්‍රබල වේද?

(1) $H_2O$ (2) $NH_3$ (3) HCl (4) ClF (5) $CO_2$

8. $Na_2O_2$ සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය වඩාත්ම ගැලපේද?

(1) මේ සංයෝගයේදී සෝඩියම් හි ඔක්සිකරණ තත්වය +2 වේ.
(2) මේ සංයෝගයේදී ඔක්සිජන් හි ඔක්සිකරණ තත්ත්වය -1 වේ.
(3) මෙහිදී සෝඩියම් සඳහා ඔක්සිකරණ අංකයක් දිය නොහැකිය.
(4) පෙරොක්සයිඩ සලකන විට ඔක්සිකරණ තත්වය යන සංකල්පය බිඳ වැටේ.
(5) මින් එකක්වත් නොගැලපේ.

9. පරිමාව 1 $dm^3$ වන සංවෘත භාජනයක් තුළ ඇති ඔක්සිජන් වායු ස්කන්ධයක් විද්‍යුත් ක්‍රමයක් මගින් ඕසෝන් වායුව, $O_3$ බවට භාගික වශයෙන් පරිවර්තනය කරන ලදී. පරිවර්තනයෙන් පසු වායු මිශ්‍රණය ආරම්භක උෂ්ණත්වයට නැවත පත් වූ විට, මිශ්‍රණයේ නව පීඩනය ආරම්භක ඔක්සිජන් පීඩනයෙන් 90% ක් විය. වායු මිශ්‍රණයේ පරිමාව අනුව, ඕසෝන් ප්‍රතිශතය කොපමණ වේද?

(1) 33.33% (2) 30% (3) 20% (4) 22.22% (5) 11.11%

10. විකිරණශීලී සමස්ථානිකයක අර්ධ - ආයු කාලය දින 2 ක් වේ. දින 22 ක් ගතවූ පසු මෙම සමස්ථානිකයේ නිදර්ශකයක විකිරණශීලතාව කොපමණ වේද?

(1) ආරම්භක අගයෙන් 10% ක් පමණ වේ.
(2) ආරම්භක අගයෙන් 1‰ පමණ වේ.
(3) ආරම්භක අගයෙන් 1% ක් පමණ වේ.
(4) ආරම්භක අගයෙන් 0.05% පමණ වේ.
(5) ආරම්භක අගයෙන් 0.1% පමණ වේ.

11. ජලීය ද්‍රාවණයේදී වඩාත්ම ආම්ලික වන්නේ මින් කුමන සංයෝගයද?

(1) $N_2O_5$ (2) $P_2O_5$ (3) $N_2O_3$ (4) $Br_2O$ (5) $Cl_2O$

12. රත්කළ විට මින් කුමන සංයෝගය $N_2O_4$ ලබා දෙයිද?

(1) $N_2O$ (2) $HNO_3$ (3) $NaNO_3$
(4) $NH_4NO_3$ (5) $(NH_4)_2Cr_2O_7$

13. $Zn(s)|Zn^{2+}(aq)$ යන ඉලෙක්ට්‍රෝඩයේවි.ගා.බ. $Zn^{2+}$ සාන්ද්‍රණය සමඟ විචලනය වීම සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?

(1) පළමුවැනි පැරඩේ නියමය මගින් එම විචලනය ප්‍රමාණාත්මකව අවබෝධ කරගත හැකිය.
(2) පළමුවැනි පැරඩේ නියමය මගින් එම විචලනය ගුණාත්මකව අවබෝධ කරගත හැකිය.
(3) දෙවැනි පැරඩේ නියමය මගින් එම විචලනය ගුණාත්මකව අවබෝධ කරගත හැකිය.

www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

33. ශිෂ්‍යයෙක් 1.0 mol dm$^{-3}$ වන ජලීය HBr සහ 0.1 mol dm$^{-3}$ වන ජලීය HI එක සමාන පරිමාවලින් ගෙන මිශ්‍රණයක් සෑදුවේය. ඉන්පසු ඔහු Pt ඉලෙක්ට්‍රෝඩ භාවිතා කරමින් එම මිශ්‍රණය විද්‍යුත් විච්ඡේදනය කිරීම ආරම්භ කළේය. ශිෂ්‍යයා විසින් කරනු ලබන මේ පරීක්ෂණය සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?
(a) පරීක්ෂණය ආරම්භයේදී ඇනෝඩයෙන් $I_2$ මුක්ත වේ.
(b) පරීක්ෂණය ආරම්භයේදී ඇනෝඩයෙන් $Br_2$ මුක්ත වේ.
(c) පරීක්ෂණයේදී කැතෝඩයෙන් $H_2$ මුක්ත වේ.
(d) පරීක්ෂණය ආරම්භයේදී ඇනෝඩයෙන් $O_2$ මුක්ත වේ.

34. හයිඩ්‍රජන් බන්ධන සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?
(a) -OH කාණ්ඩය නැතිවිට වුවත් හයිඩ්‍රජන් බන්ධන ඇති විය හැකිය.
(b) හයිඩ්‍රජන් බන්ධනවලින් තොරව අප දන්නා ආකාරයේ ජීවය පැවතිය නොහැකිය.
(c) හයිඩ්‍රජන් බන්ධනයක ශක්තිය C-H බන්ධනයක ශක්තිය පමණටම ඉහළ විය හැකිය.
(d) හයිඩ්‍රජන් අණුවේ පවතින්නේ අති විශේෂ වර්ගයේ හයිඩ්‍රජන් බන්ධනයකි.

35. රබර් සම්බන්ධව මින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?
(a) ස්වභාවික රබර්වල ව්‍යුහ ඒකකය-($CH_2$-CH=CH-$CH_2$)-වේ.
(b) ස්වභාවික රබර් $CH_2=C(CH_3)-CH=CH_2$ හි බහු අවයවිකයක් වේ.
(c) මෝටර් රථ ටයරයක ඇති රබර් දැවූ විට $CO_2$, $H_2O$ සහ $SO_2$ ලැබේ.
(d) $CH_2=CHCl$ බහු අවයවිකරණයට භාජනය කිරීමෙන් කෘත්‍රිම රබර් ලබාගත හැකිය.

36. $C_6H_5CH_2Cl$ සහ $C_6H_5Cl$ සම්බන්ධව මින් කුමන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
(a) $C_6H_5CH_2Cl$ පහසුවෙන් ජල විච්ඡේදනය වේ.
(b) $C_6H_5CH_2Cl$ ඇරෝමැටික ද්විතියික හේලයිඩයකි.
(c) $C_6H_5Cl$ ප්‍රාථමික හේලයිඩයකි.
(d) $C_6H_5Cl$ නයිට්‍රොකරණයට භාජනය වේ.

37. $A(s) + B(g) \rightleftharpoons L(s) + M(g) : \Delta H^\circ > 0$ මින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ මේ සමතුලිතය සඳහා ගැලපේද?
(a) නියත උෂ්ණත්වයේදී Kc පද්ධතියේ සමස්ත පීඩනය සමඟ වෙනස් වේ.
(b) නියත උෂ්ණත්වයේදී Kp,B සහ M හි සාන්ද්‍රණය සමඟ වෙනස් වේ.
(c) Kc උෂ්ණත්වය සමඟ වෙනස් වේ.
(d) Kp සහ Kc එක සමාන වේ.

38. පහත සඳහන් කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?
(a) ක්ෂාර ලෝහ ඇතැම් අවස්ථාවලදී ද්වි-සංයුජ සංයෝග සාදයි.
(b) ක්ෂාරීය පාංශු ලෝහ ඇතැම් අවස්ථාවලදී ඒක-සංයුජ සංයෝග සාදයි.
(c) ඇතැම් ක්ෂාර ලෝහ ක්ලෝරයිඩ ජලයේ ද්‍රාවණය නොවේ.
(d) ඇතැම් ක්ෂාරීය පාංශු ලෝහ ඔක්සයිඩ ජලයේ ද්‍රවණය නොවේ.

39. අයනීකරණ ශක්ති සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය /ප්‍රකාශ සත්‍ය වේද?
(a) සෝඩියම් හි දෙවැනි අයනීකරණ ශක්තිය, පොටෑසියම් හි දෙවැනි අයනීකරණ ශක්තියට වඩා කුඩා වේ.
(b) තුන්වන ආවර්තයේ මූලද්‍රව්‍ය සියල්ලෙහිම පළමුවැනි අයනීකරණ ශක්ති ලාක්ෂණික අක්-වක් විචලනයක් දක්වයි.
(c) හතරවැනි ආවර්තයේ මූලද්‍රව්‍ය සියල්ලෙහිම පළමුවැනි අයනීකරණ ශක්ති ලාක්ෂණික අක්-වක් විචලනයක් දක්වයි.
(d) බෝරෝන්හි හතරවැනි අයනීකරණ ශක්තිය කාබන්හි පස්වැනි අයනීකරණ ශක්තියට වඩා විශාල වේ.

40. පහත සඳහන් කුමන ප්‍රකාශය/ ප්‍රකාශ කුරුඳු තෙල් සම්බන්ධයෙන් ගැලපේද?
(a) කුරුඳු තෙලෙහි ප්‍රධාන සංඝටකය අයඩොෆෝම් ප්‍රතික්‍රියාවට පිළිතුරු දෙයි.
(b) කුරුඳු තෙල් බෙඩ් ප්‍රතිකාරකය සමඟ අවක්ෂේපයක් දෙයි.
(c) කුරුඳු තෙල් බ්‍රෝමින් දියර අවර්ණ කරයි.
(d) ජෙරනියෝල් කුරුඳු තෙලෙහි ප්‍රධාන සංඝටකයක් වේ.

41 සිට 50 දක්වා ප්‍රශ්නවල වගන්ති යුගල බැගින් දී ඇත.

| පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|
| (1) සත්‍යය. | සත්‍යවන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි. |
| (2) සත්‍යය. | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි. |
| (3) සත්‍යය. | අසත්‍යය. |
| (4) අසත්‍යය. | සත්‍යය. |
| (5) අසත්‍යය. | අසත්‍යය. |

| පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|
| 41. උණු සාන්ද්‍ර $HNO_3/H_2SO_4$ මිශ්‍රණය මගින් නයිට්‍රොබෙන්සීන් නයිට්‍රොකරණය කරණ යෙන් ලැබෙන්නේ 1,3 ඩයිනයිට්‍රොබෙන්සීන්ය. | $-NO_2$ කාණ්ඩය නයිට්‍රොබෙන්සීන් අණුවේ 3 ස්ථානය සක්‍රිය කරයි. |
| 42. $Br_2$ දියරයෙහි වර්ණය ෆීනෝල් මගින් ඉවත් කෙරේ. | ෆීනෝල් අසන්තෘප්ත සංයෝගයකි. |
| 43. $H_2S$ වලට ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කළ නොහැක. | $H_2S$ හිදී සල්ෆර් අවම ඔක්සිකරණ තත්ත්වයේ පවතී. |
| 44. ඇල්ෆා අංශුවල ගමන්මාර්ගය චුම්භක ක්ෂේත්‍ර මගින් වෙනස් නොවේ. | ඇල්ෆා අංශු ආලෝකයේ ප්‍රවේගයෙන් ගමන් කරයි. |
| 45. හේබර් ක්‍රමය මගින් ඇමෝනියා නිෂ්පාදනය කිරීමේදී වඩා හොඳ ඵලදාවක් ලබා ගැනීම සඳහා ඉහළ පීඩන උපයෝගී කර ගනී. | $N_{2(g)} + 3H_{2(g)} \rightleftharpoons 2NH_{3(g)}$ යන සමතුලිත ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය පීඩනයේ වැඩිවීමත් සමඟ අඩු වේ. |
| 46. හයිඩ්‍රජන් පරමාණුවේ වර්ණාවලියේ එක් එක් ශ්‍රේණියේ අනුයාත රේඛා දෙකක් අතර ඇති සංඛ්‍යාත පරතරය වර්ණාවලි රේඛා වල සංඛ්‍යාතය වැඩිවන විට සීඝ්‍රයෙන් අඩු වේ. | න්‍යෂ්ටියේ සිට ඇති දුර වැඩිවන විට හයිඩ්‍රජන් පරමාණුවේ අනුයාත ශක්ති මට්ටම්වල ශක්ති අගයන් සීඝ්‍රයෙන් එකිනෙකට ළඟා වේ. |
| 47. එකිනෙකින් වෙනස් තත්ත්ව දෙකක් යටතේ $HNO_3$ සමඟ කොපර් ප්‍රතික්‍රියා කරවීමෙන් NO සහ $NO_2$ ලබාගත හැකිය. | $Cu^+$ සහ $Cu^{2+}$ යන ඔක්සිකරණ තත්ත්ව දෙකකින් කොපර් තිබිය හැකිය. |
| 48. කෝස්ටික් සෝඩා නිෂ්පාදනයේදී අයන් ඇනෝඩ භාවිතා නොකෙරේ. | අයන් විඛාදනයට භාජනය වේ. |
| 49. ජලීය ඇමෝනියම් ඇසිටේට් ද්‍රාවණයකට ස්වාරක්ෂක ක්‍රියාව දැක්විය නොහැකිය. | ජලීය ඇමෝනියම් ඇසිටේට් ද්‍රාවණයක් ස්වාරක්ෂක ක්‍රියාව දක්වන්නේ ඇසිටික් අම්ලය ඇතිවිට පමණි. |
| 50. සිහින් ලෝහ පත්‍ර මගින් ගැමා කිරණ ප්‍රකිරණය වේ. | ලෝහ පරමාණු තුළ ඇති පදාර්ථයෙන් ඉතාමත් විශාල කොටසක් ධන ආරෝපිත ලක්ෂ්‍ය ස්කන්ධ ලෙස පවතී. |

51. $CH_3CH_2CONH_2$ සෝඩියම් සහ එතනෝල් සමඟ ප්‍රතික්‍රියා කර, මින් කුමක් ලබා දෙයිද?
(1) $CH_3CH_2COONa + CH_3CH_2NH_2$  (3) $CH_3CH_2CH_2NH_2$
(2) $CH_3CH_2COOCH_2CH_3 + NH_3$  (4) $CH_3CH_2NH_2$
(5) මින් එකක්වත් ලබා නොදෙයි.

52. මින් කුමන සංයෝගයට ප්‍රකාශ සක්‍රියතාව දැක්විය හැකි වේද?
(1) $(CH_3)_2C(NH_2)CH_2CH_2COOH$  (2) $H_2NCH_2COOH$
(3) $H_2NCH_2CH_2COOH$  (4) HCFClBr
(5) මින් එකකටවත් ප්‍රකාශ සක්‍රියතාව දැක්විය හැකි නොවේ.

53. ද්‍රවයක අවලම්බනය කරන ලද ඉතා කුඩා ඝන අංශු නොකඩවාම අහඹු ලෙස චලනය වේ. මේ නිරීක්ෂණය වඩාත්ම උචිත වශයෙන් සම්බන්ධ කළ හැකි වන්නේ මින් කුමක් සමඟද?
(1) ඝනය අසන්තතික වේ.  (2) ද්‍රවය අසන්තතික වේ.
(3) ඝනය සහ ද්‍රවය යන දෙකම අසන්තතික වේ.
(4) පදාර්ථය පරමාණුවලින් සමන්විත වේ.
(5) ද්‍රවය පරමාණුවලින් සමන්විත වේ.

54. $Ba(NO_3)_2$, $H_2O_2$ සහ අධික ප්‍රමාණයක් තනුක $HNO_3$ ඇති ද්‍රාවණයක් සමඟ අවක්ෂේපයක් දෙන්නේ මින් කුමක්ද?
(1) $K_2SO_3$  (2) $K_2CrO_4$
(3) $NH_4Br$  (4) $(NH_4)_2CO_3$
(5) මින් එකක්වත් අවක්ෂේපයක් නොදෙයි.

55. මින් කුමක් පොටෑසියම් සමඟ ප්‍රතික්‍රියා කරයිද?
(1) $C_5H_{12}$  (2) බෙන්සීන්  (3) $H_2$  (4) Kr
(5) මින් එකක්වත් පොටෑසියම් සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

සැ.යු. ඔබගේ යෝජිත පරිවර්තන ක්‍රමය අනවශ්‍ය ලෙස දීර්ඝ වන්නේ නම්, ඔබට උපරිම ලකුණු නොලැබේ.

(i) (ii)




(b) $H_2SO_4$ හමුවේ දී කාබොක්සිලික් අම්ලයක් හා ඇල්කොහොලයක් ප්‍රතික්‍රියා කර එස්ටරයක් සෑදීමේ ප්‍රතික්‍රියාවට අදාළ යාන්ත්‍රණය පැහැදිලිව දක්වන්න.

(c) 4 - නයිට්‍රොෆීනෝල්, ෆීනෝල් වලට වඩා ප්‍රබල අම්ලයක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(d) බෙරිලින් නිදර්ශකයක් සහ ෆීනෝල් ෆෝමැල්ඩිහයිඩ් (ෆීනෝල් මෙතනැල්) බහු අවයවිකයක නිදර්ශකයක් ඔබට සපයා තිබේ. මේ ද්‍රව්‍ය එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා රසායනික ක්‍රමයක් යෝජනා කරන්න.

## "ආ" - කොටස - රචනා

5. (a) අදාළ වායු නියම එකට සංයෝජනය කරමින් පරිපූර්ණ වායු නියමය ලබා ගන්න.

(b) අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍යයෙකු විසින් සංශුද්ධ $CaCO_3$ 10.00g සම්පූර්ණ වශයෙන් තාප වියෝජනයට භාජනය කිරීමෙන් උෂ්ණත්වය $10^0C$ දී හා පීඩනය 2.00 atm යටතේදී $CO_2$ වායුව $1.12\,l$ එකතු කර ගන්නා ලදී. මේ ශිෂ්‍යයා විසින් ලබා ගෙන ඇති පරීක්ෂණාත්මක දත්ත උපයෝගී කර ගනිමින් R යන සර්වත්‍ර වායු නියතය ගණනය කරන්න.
(නිරපේක්ෂ ශූන්‍ය උෂ්ණත්වය $=-273^0C$, $Ca=40.00$, $O=16.00$, $C=12$)

(c) R සඳහා පිළිගෙන ඇති සම්මත අගයත්, ඉහත (b) හි ශිෂ්‍යයා විසින් රැස්කර ගෙන ඇති දත්ත වලින් ලැබෙන අගයත් අතර වෙනසක් ඇති වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි හේතු සාකච්ඡා කරන්න.

(d) වායු පිළිබඳ චාලකවාදයේදී හමුවන $PV=\frac{1}{3}mN\overline{c^2}$ යන සමීකරණය උපකල්පනය කරමින් ඇවගාඩ්‍රෝ නියමය ව්‍යුත්පන්න කරන්න.

6. (a) (1) පීඩනය වෙනස් කිරීමෙන්
(2) උෂ්ණත්වය වෙනස් කිරීමෙන්
යන මේ දෙආකාරයෙන් $N_2O_{4(g)} \rightleftharpoons 2NO_{2(g)}$ යන පද්ධතියේ සමතුලිතතාව කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බව ඔබ පරීක්ෂණාත්මකව පෙන්වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(b) $AB_{(g)}+AB_{2(g)} \rightleftharpoons A_2B_{3(g)}$ යන සමතුලිතතාව සලකන්න. AB සහ $AB_2$ එක සමාන මවුල ප්‍රමාණවලින් ගෙන සංවෘත භාජනයක් තුළ තබා, නිසියම් උෂ්ණත්වයකදී සමතුලිතතාව ඇති වන්නට ඉඩ හරින ලදී. එම සමතුලිත අවස්ථාවේදී ආරම්භ AB ප්‍රමාණයෙන් 25% ක් ප්‍රතික්‍රියා නොකර ඉතිරිව තිබෙන අතර, භාජනය තුළ සමස්ත පීඩනය 5atm වේ. මේ උෂ්ණත්වයේදී ප්‍රතික්‍රියාවේ Kp අගය ගණනය කරන්න.

(c) මේවා පහදා දෙන්න.
(1) ජලීය $KHCO_3$ ද්‍රාවණයක් ස්වාරක්ෂක ක්‍රියාව දක්වන නමුත්, ජලීය $KHSO_4$ ද්‍රාවණයක් එම හැසිරීම නොදක්වයි.
(2) ජලීය $NH_3$ ජලීය HI සමඟ අනුමාපනය කිරීමේ අන්තලක්ෂ්‍යය නිර්ණය කිරීම සඳහා දර්ශකය වශයෙන් ෆිනොප්තැලීන් උපයෝගී කරගත නොහැකිය.

(d) විද්‍යුත් රසායනික කෝෂයක් පහත නිරූපණය කර ඇත.
$M(s)|M^{+1}(aq\ 1.0\ mol\ l^{-1})\ \vdots\ Zn^{+2}(aq,\ 1.0\ mol\ l^{-1})|Zn(s)$ $25^0C$ දී මෙම කෝෂයේ වි.ගා.බ. වෝල්ට් + 0.90 වේ.
(1) මේ කෝෂයේ කැතෝඩ ප්‍රතික්‍රියාව කුමක්ද?
(2) මේ කෝෂයෙන් විද්‍යුත් ධාරාවක් ලබා ගන්නා විට සිදුවන රසායනික ප්‍රතික්‍රියාව කුමක්ද?

7. (a) මේවා අර්ථ දක්වන්න.
(1) සංයෝගයක දහනය වීමේ සම්මත එන්තැල්පිය
(2) සංයෝගයක උත්පාදනයේ සම්මත එන්තැල්පිය

(b) පහත දැක්වෙන වගුවේ සඳහන් දත්ත උපයෝගී කර ගනිමින්, උෂ්ණ තාප රසායනික චක්‍රයක් මගින් හෝ, එන්තල්පි රූප සටහනක් මගින් හෝ, [illegible] සුක්‍රෝස්වල ($C_{12}H_{22}O_{11}$) උත්පාදනයේ සම්මත එන්තැල්පිය ගණනය කරන්න.

දහනය වීමේ සම්මත එන්තැල්පි

| | |
|---|---|
| $H_2(g)$ | $=285.6\ kJ\ mol^{-1}$ |
| $C(s)$ (ග්‍රැෆයිට්) | $=393.1\ kJ\ mol^{-1}$ |
| $C_{12}H_{22}O_{11}(s)$ | $=5670.0\ kJmol-1$ |

(c) රසායනික චාලක විද්‍යාවේ සංකල්ප අනුව $X_{2(g)}+Y_{2(g)} \rightarrow 2XY_{(g)}$ යන ප්‍රතික්‍රියාව සිදුවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කවරේද?

(d) විකිරණශීලී සමස්ථානික කෘෂි කර්මය, කර්මාන්ත අංශය හා වෛද්‍ය කර්මයෙහි විවිධ කාර්ය සඳහා යොදා ගැනීම පිළිබඳ කෙටි රචනයක් ලියන්න.
සැ. යු. මෙහිදී එවැනි යෙදුම් හතරක් පමණක් සලකා බැලීම ප්‍රමාණවත් වේ. ඉහත එක් එක් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් එක් යෙදුමක්වත් සඳහන් කළ යුතුය.

## "ඉ" කොටස - රචනා

8. (a) පහත සඳහන් සංයෝග සමඟ සල්ෆර් කවර තත්ත්ව යටතේ කෙසේ ප්‍රතික්‍රියා කරයිද?
සැ. යු. මේ ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ඔබ විසින් ලිවිය යුතුය.
(1) $H_2SO_4$ (2) $HNO_3$

(b) $H_2S$ සහ $SO_2$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා රසායනික පරීක්ෂාවක් සඳහන් කර ඊට අදාළ තුලිත සමීකරණය/සමීකරණ ලියන්න.

(c) පහත ඉදිරිපත් කර ඇති පරිවර්තන සිදුකළ හැකි ආකාරය දක්වන්න. අවශ්‍ය ප්‍රතිකාරක හා ප්‍රතික්‍රියා තත්ත්ව උචිත ස්ථානවල සඳහන් කළ යුතුය.
සැ. යු. රසායනික සමීකරණ තුලනය කිරීම අවශ්‍ය නොවේ.
(1) $N_2 \rightarrow KNO_3$ (2) $HNO_3 \rightarrow HNO_2$

(d) ඔබට පරීක්ෂණාගාරයේදී හයිඩ්‍රජන් සහ ලෝහමය මූලද්‍රව්‍යය සපයා නැතැයි සිතන්න. ක්ලෝරීන්, බ්‍රෝමීන්, අයඩීන් සහ සාමාන්‍ය රසායනික ද්‍රව්‍ය සපයා ඇතැයි සිතන්න. හැලජනවල ප්‍රතික්‍රියතාව $Cl_2>Br_2>I_2$ බව ඔබ මේ පරීක්ෂණාගාර තත්ව යටතේ පෙන්වන්නේ කෙසේද?

9. (a) සෝඩියම් ලෝහය වාතයට නිරාවරණය කර තැබීමේදී සිදුවන රසායනික විපර්යාස විස්තර කරන්න.
සැ. යු. අදාළ තුලිත සමීකරණය ලිවිය යුතුය.

(b) ඔබ විසින් තෝරා ගන්නා ස්වභාවික ප්‍රභවයක් උපයෝගී කර ගනිමින් මැග්නීසියම් ලෝහය නිස්සාරණය කර ගැනීම හා සම්බන්ධ වන රසායනික ප්‍රතික්‍රියා සඳහන් කරන්න.
සැ. යු. මේ ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ඔබ විසින් ලිවිය යුතුය.

(c) $PH_3$, $H_2S$ සහ HCl යන මේ හයිඩ්‍රයිඩවල අම්ල-භෂ්ම ස්වභාවය විචලනය වන ආකාරය පහදා දෙන්න.

(d) ඔබට විද්‍යාගාරයේදී හයිඩ්‍රජන් ($H_2$) නිදර්ශකයක් සහ එහි සමස්ථානිකය වන ඩියුටීරියම් ($D_2$) නිදර්ශකයක් සපයා තිබේ. ප්ලැටිනම් වැනි අන්තරීක ලෝහ උත්ප්‍රේරක ඔබට සපයා නැත. නමුත් සාමාන්‍යයෙන් විද්‍යාගාරයේදී භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ඔබට සපයා ඇත. හයිඩ්‍රජන් වලට ආවර්තිතා වගුවේ හිමිවන ස්ථානය පිළිබඳ ඔබගේ දැනුම ආධාර කරගනිමින්, ඉහත විද්‍යාගාර තත්වය යටතේ $H_2$ හෝ $D_2$ අපද්‍රව්‍ය වශයෙන් නොමැති සංශුද්ධ HD වායුව නිදර්ශකයක් ඔබ ලබා ගන්නේ කෙසේදැයි පහදා දෙන්න.

10. (a) මේ එක් එක් ද්‍රව්‍යයේ ඇති ප්‍රධාන මූලද්‍රව්‍ය නම් කරන්න.
(1) මොනසයිට් (2) රතු කැට (තම් මැණික් වර්ගය)
(3) ඉල්මනයිට්

(b) කෝස්ටික් සෝඩා - ක්ලෝරීන් කර්මාන්තය සහ [illegible] පොහොර නිෂ්පාදනය කිරීම යන මේවා මගින් සිදුවන පරිසර දූෂණය පිළිබඳ රචනයක් ලියන්න.
සැ. යු. උක්ත පරිසර දූෂණය වළක්වාලීම පිළිබඳවද මේ රචනයේදී සලකා බැලිය යුතු වේ.

(c) සේරුවිලෙන් ලබාගත් $CuFeS_2$ ලෝපස් නිදර්ශකයක් ඔබට සපයා ඇත. මෙහි ඇති කොපර් සහ සල්ෆර් ප්‍රතිශත පරීක්ෂණාත්මකව නිර්ණය කරන්නට ඔබ තැත් කරන්නේ කෙසේද?
සැ. යු. මෙහිදී සම්මත විශ්ලේෂණ ක්‍රම ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඔබ විසින් යෝජනා කරන ක්‍රමවල නිරවද්‍යතාව උසස් නොවුවත් එම ක්‍රමවල සෛද්ධාන්තික පදනම් හේතු සහගත වේ නම් ඔබේ [illegible] ලකුණු ලබා ගැනීමට හැකි වේ.

www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras